# විභාග දැන්වීම

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ රියදුරු සේවයේ I ,II හා III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2023

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා අදාළ වන අංක 1875/39 හා 2014 අගෝස්තු මස 15 වැනි සිකුරාදා දිනැතිව නිකුත් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කරන ලද රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2015 ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ රියදුරු සේවයේ I ,II හා III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පළමු, දෙවන සහ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් විසින් 2023 ජූලි මස 05 දින ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් අදාළ දිනදී නියමිත වේලාවට විභාගය සඳහා ඉදිරිපත් විය යුතු අතර නියමිත වේලාවෙන් පසුව පැමිණෙන නිලධාරීන් හට විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාවක් හිමි නොවේ.

(iii) විභාග අපේක්ෂකයින් ඒ ඒ ශ්‍රේණිය සඳහා අදාළ වන විභාග නිවේදනයේ සඳහන් සියලු පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතුය.

03. අයදුම්පත්

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය භාවිතකොට අයදුම්පත පිළියෙල කළ යුතුය. අයදුම්පත අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කර සහතික කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් 2023 ජූනි මස 09 වැනි දිනට පෙර ලැබෙන සේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (පාලන) වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඒ ඒ ශ්‍රේණිවලට අදාළව විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්වලට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

විභාග අපේක්ෂකයින් ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

04. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

05. අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කළ පසුව සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිකුත් කෙරෙන විභාගය සඳහා කැඳවීම් ලිපිය විභාගය පැවැත්වෙන දිනයේදී අයදුම්කරුවන් විසින් රැගෙන ආ යුතුය. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා කැඳවා නොමැති කිසිඳු නිලධාරියෙකු හට විභාගයට පෙනී සිටීමට අවස්ථාව හිමි නොවේ.

06. අයදුම්කරුවන් විසින් මතු දැක්වෙන ලිපි ලේඛන පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

1. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපිය
2. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
3. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

07. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණය (පරිශිෂ්ඨය 01) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණය (පරිශිෂ්ඨය 02) |
| තෙවන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ(05) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (පරිශිෂ්ඨය 03) |

7.1 අන්තර්කාලීන විධිවිධාන

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි ව්‍යවස්ථාව යටතේ I පන්තියට පත්වී සිටින නිලධරයන් I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

අයි. එස්. එච්. ජේ. ඉළුක්පිටිය

පාලක ජනරාල්

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

අයි.එස්.එච්.ජේ. ඉළුක්පිටිය
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

දිනය : 2023.05. 15......

විභාග පටිපාටිය :

අයදුම්පත්‍ර - 01

(පරිශිෂ්ඨය 01)

**ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය**
**ආදර්ශ අයදුම්පත්‍රය**

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :- ..........................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :- ..........................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................................
4. රියදුරු සේවයට පළමුව ඇතුලත් වූ දිනය :- ..............................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ..............................................
6. III ශ්‍රේණියේ සේවයේ වසර තුනක් සම්පූර්ණ වන දිනය :- ..............................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :- .............................................. ..........................................................

අයදුම්කරුගේ අත්සන

---

II කොටස

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම නිලධාරියා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත.

දිනය: ..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම
පදවි නාමය
(නිල මුද්‍රාව)

(පරිශිෂ්ඨය 02)

අයදුම්පත්‍ර - 02

**<u>ඒකාබද්ධ රියදුරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>**
**<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>**

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :- ..........................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :- ..........................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................................
4. රියදුරු සේවයට පළමුව ඇතුලත් වූ දිනය :- ..............................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ..............................................
6. II ශ්‍රේණියට උසස් වූ දිනය :- ..............................................
7. II ශ්‍රේණියට උසස් කළ ලිපියේ අංකය හා දිනය :- ..............................................
8. II ශ්‍රේණියේ සේවයේ වසර තුනක් සම්පූර්ණ කරන දිනය :- ..............................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :- ..............................................

..........................................................
අයදුම්කරුගේ අත්සන

---

II කොටස
අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම නිලධාරියා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත.

දිනය: ..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම
පදවි නාමය
(නිල මුද්‍රාව)

අයදුම්පත්‍ර - 03

(පරිශිෂ්ඨය 03)

## ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය
## ආදර්ශ අයදුම්පත්‍රය

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :- ..........................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :- ..........................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................................
4. රියදුරු සේවයට පළමුව ඇතුලත් වූ දිනය :- ............................................
5. සේවය ස්ථිර කරන ලද දිනය :- ............................................
6. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ............................................
7. I ශ්‍රේණියට උසස් වූ දිනය :- ............................................
8. I ශ්‍රේණියට උසස් කරන ලද ලිපියේ අංකය හා දිනය :- ............................................
7. I ශ්‍රේණියේ සේවයේ වසර පහක් සම්පූර්ණ වන දිනය :- ............................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :- ............................................ ........................................................

අයදුම්කරුගේ අත්සන

---

II කොටස

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම නිලධාරියා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත.

දිනය: ................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම
පදවි නාමය
(නිල මුද්‍රාව)